# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 281 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 16/02/2024 පැය 1330

## මාධ්‍ය නිවේදනය

**අතුරුදහන් වූ ගැහැණු දරුවකුගේ මෘත ශරිරය හමුවීම - තලෛයිමන්නාරම පොලිස් වසම**

2024.02.15 වන දින රාත්‍රී කාලයේ තලෛයිමන්නාරම පොලිස් වසමේ එම්.එන් 48, තලෛයිමන්නාරම ග්‍රාමය, උතුර ප්‍රදේශයේ වයස අවුරුදු 10 ක දැරියක් අතුරුදහන්වී ඇති බවට ඇයගේ මිත්තණිය විසින් තලෛයිමන්නාරම පොලිසියට සිදු කල පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

අතුරුදහන් වූ දැරියගේ මෘතශරිරය අද දින උදෑසන දැරිය පදිංචි නිවසේ සිට මීටර් 300 කට ආසන්න දුරින් ඉඩමක තිබී පොලිසිය විසින් සොයාගෙන ඇත. මෘතශරිරය සොයා ගන්නා අවස්ථාවේදී දැරිය ගවුමක් ඇද සිට ඇති අතර යටි කය නිරුවත්ව තිබී ඇත. මෙම දැරිය ස්ත්‍රී දුෂණයට ලක්වී තිබේද යන්න පොලිසිය සැකකරනු ලබයි.

මෘතශරිරය සම්බන්ධයෙන් මන්නාරම ගරු මහේස්ත්‍රාත් තුමා හා මන්නාරම අධිකරණ වෛද්‍ය නිලධාරි පැමිණ නිරීක්ෂණය කර ඇති අතර ගරු මහේස්ත්‍රාත්තුමා විසින් මහේස්ත්‍රාත් පරීක්ෂණයක් සිදු කර ඇත. පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සඳහා මෘතශරිරය මන්නාරම රෝහලේ මෘතශරිරාගාරයේ තැන්පත් කර ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් තලෛයිමන්නාරම පොලිසිය එම ප්‍රදේශයේ පදිංචි සැකකටයුතු පුද්ගලයෙකු කෙරෙහි අවධානය යොමු වී ඇති අතර, තලෛයිමන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**